# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2330/02 - 2023 මැයි මස 02 වැනි අඟහරුවාදා - 2023.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**පොලොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහල් ස්ථාපිත කිරීම**

මහජන චීන සමූහාණ්ඩුවේ ප්‍රදානයක් ලෙස අභිනවයෙන් ඉදිකරන ලද ඇඳන් 200කින් සමන්විත පොලොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහල, 2021 ජුනි මස 11 දින ජනතා අයිතියට පත්කරන ලදී. මෙම රෝහල, නව රෝහල් වර්ගීකරණය අනුව විශේෂිත රෝහලක් ලෙස කාණ්ඩගත කර ඇත.

ඒ අනුව, පොලොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහල, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන අතර වකුගඩු හා සම්බන්ධ රෝග සඳහා අවශ්‍ය සෞඛ්‍ය සේවා පහසුකම් ලබාදීම සඳහා ස්ථාපිත කරන ලද බව ප්‍රකාශයට පත් කරමි. පහත සඳහන් ලිපිනයේ මෙම රෝහල පිහිටා ඇති අතර ආයතන ප්‍රධානියා අධ්‍යක්ෂ වේ.

ලිපිනය - ජාතික වෘක්කවේද විශේෂිත රෝහල, පොලොන්නරුව

දුරකථන අංකය - 027 2030300

මෙම රෝහල හා සම්බන්ධ අනෙකුත් තොරතුරු පහත සඳහන් කරමි.

| | | |
|---|---|---|
| 01 | ආයතනයේ නම | ජාතික වෘක්කවේද විශේෂිත රෝහල, පොලොන්නරුව |
| 02 | විෂයය පථය | රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 03 | පරිපාලන දිස්ත්‍රික්කය | පොලොන්නරුව |
| 04 | ඡන්ද කොට්ඨාසය | පොලොන්නරුව |
| 05 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තමන්කඩුව |
| 06 | ආසන්නතම පරිපාලන කාර්යාලය | ජාතික වෘක්කවේද විශේෂිත රෝහල, පොලොන්නරුව |

1A - G 39420 — 56 (2023/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | | |
|---|---|---|
| 07 | ආයතන භාර නිලධාරි | අධ්‍යක්ෂ |
| 08 | වාර්තා කළ යුතු නිලධාරියා | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| 09 | තැපැල් හා විදුලි ලිපි කාර්යාලය | 172 - පොලොන්නරුව නගරය |
| 10 | ආසන්නතම දුම්රිය ස්ථානය | කඳුරුවෙල |
| 11 | පොලිස් ස්ථානය | පොලොන්නරුව |

**එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,**
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

අංක 385,
"සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

EOG 05 - 0001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.